| | | | |
|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | ) 0112669192 , 0112675011<br>) 0112698507 , 0112694033<br>) 0112675449 , 0112675280 | මගේ අංකය<br>எனது இல<br>My No. | )<br>)NA/06/T/10/2017<br>) |
| ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | ) 0112693866<br>) 0112693869<br>)0112692913 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. : | )<br>)<br>) |
| විද්‍යුත් තැපෑල<br>மின்னஞ்சல் முகவரி<br>e-mail | )postmaster@health.gov.lk<br>)<br>) | දිනය<br>திகதி<br>Date | )<br>)2018.12.<br>) |
| වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>website | ) www.health.gov.lk<br>)<br>) | | |

සුවසිරිපාය

**SUWASIRIPAYA**

# සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார,போசணைமற்றும் சுதேசவைத்தியஅமைச்சு
# Ministry of Health, Nutrition& Indigenous Medicine


නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් , ශ්‍රී ලංකා ජාතික රෝහල.
ශික්ෂණ රෝහල්/මහ රෝහල් /අධ්‍යක්ෂවරුන් හා
මූලික රෝහල්වල වෛද්‍ය අධිකාරීන් ,
ඇතුළු සියළුම ආයතන ප්‍රධානීන් වෙත.

<u>හෙද/හෙදි නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2017 අභියාචනා කැඳවීම.</u>

හෙද/හෙදි නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු ලබා දීමට අදාළව නිකුත් කරන ලද අංක 01-40-2017 හා 2017.07.28 දිනැති ස්ථාන මාරු චක්‍රලේඛය හා බැඳේ.

02. ඒ අනුව ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කරන ලද හෙද නිලධාරීන් අතරින් මාරු මණ්ඩලය හරහා ස්ථාන මාරු නිර්දේශ වී ඇති හෙද නිලධාරීන්ගේ හා නිර්දේශ වී නොමැති නිලධාරීන්ගේ තොරතුරු ඇතුලත් නාම ලේඛනය මේ සමග වේ. එසේම 2016 වාර්ෂික ස්ථාන මාරු ලේඛනය ඇතුළුව ඊට පෙර වාර්ෂික ස්ථාන මාරු නියෝග ලද, අනුප්‍රාප්තිකයින් ඉල්ලා පුරප්පාඩු නොමැති වීම මත අනුප්‍රාප්තිකයින් ලබා නොදුන් නිලධාරීන්ගේ නම් මෙම ලේඛනයට ඇතුලත් කර ඇති අතර ඒ අනුව 2017 වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛයට පෙර නිකුත් කරන ලද ස්ථාන මාරු චක්‍රලේඛවලට අනුව මෙතෙක් ක්‍රියාත්මක වී නොමැති නිලධාරීන්ගේ ස්ථාන මාරු නියෝග 2018.11.30 දිනෙන් පසුව අවලංගු කෙරේ.මින් ඉදිරියට 2017 වාර්ෂික ස්ථාන මාරු ලේඛනයේ නම් සඳහන් නිලධාරීන්ට පමණක් අනුප්‍රාප්තිකයින් ලබා දීමට නියමිත බව කාරුණිකව දන්වා සිටිමි.

03. මෙම නිලධාරීන් අතුරින් වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය 2016.12.31 දිනට වසර හතරක (04)ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන්ට හා අපේක්ෂා රෝහල, අංගොඩ මූලික රෝහල,ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය හා වැලිසර ළය රෝහල යන සේවා ස්ථානවල 2016.12.31 දිනට වසර දෙක(02)ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන්ට මුල් පත්වීම් දිනට ජ්‍යෙෂ්ඨතාවය සලකා ස්ථාන මාරු නිර්දේශ ලබාදෙන ලදී.

04. මෙම ස්ථාන මාරු ලේඛනයේ නිර්දේශය යටතේ <u>**නිර්දේශ කරමු**</u> ලෙස සඳහන් කර ඇත්තේ ස්ථාන මාරු ලබා දීමට ස්ථාන මාරු මණ්ඩලයේ නිර්දේශය ලැබී ඇති නිලධාරීන්ට වන අතර **පළාත් එකඟතාව ලබා ගැනීමට යටත්ව නිර්දේශ කරමි** ලෙස සඳහන් ව ඇති අයට ස්ථාන මාරු සඳහා පළාත් අනුමැතිය නොලැබුණහොත් එම ස්ථාන මාරුව අවලංගු කිරීමට සිදුවන බව කාරුණිකව දන්වමි.

05. මෙම ස්ථාන මාරු යෝජනා සම්බන්ධව යම් පාර්ශවයකට විරෝධතා හෝ නිවැරදි කිරීම් හෝ අභියාචනා හෝ පවතී නම් එම විරෝධතා /නිවැරදි කිරීම් අභියාචනා 2018.12.17 දිනට පෙර ආයතන ප්‍රධානියා මඟින් විධිමත්ව අධ්‍යක්ෂ (පාලන)01,සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,සුවසිරිපාය,කොළඹ 10. යන ලිපිනයට දනුම් දීමට කටයුතු කරන මෙන් වැඩිදුරටත් දන්වන අතර අභියාචනා ඉදිරිපත් කළ යුතු අකෘතිය ඇමුණුම 01 මගින් දැක්වේ.

06. අදාළ අභියාචනා /විරෝධතා හා නිවැරදි කිරීම් සම්බන්ධව ස්ථාන මාරු සමාලෝචන කමිටුවේ නිර්දේශයද සැළකිල්ලට ගෙන ස්ථාන මාරු නියෝග ඇතුළත් අවසන් ලේඛනය නිකුත් කරනු ලබන බව වැඩි දුරටත් දන්වා සිටිමි.

07. ස්ථාන මාරු නියෝග අඩංගු ලේඛනය සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි (www.health.gov.lk) පළ කරනු ලබන අතර, අභියාචනා/විරෝධතා හා නිවැරදි කිරීම් සම්බන්ධ තීරණය පෞද්ගලිකව කිසිම නිලධාරියකුට දැනුම් දෙනු නොලැබේ.

ඩොනල්ඩ් මුරගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්( පාලන)02

ඩොනල්ඩ් මුරගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

අ/කළේ - වසන්තා පෙරේරා
ලේකම් ,
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.